**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය**

---

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 26 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 309.30 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 268.24 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 41.06 ක් හෙවත් සියයට 13.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | ඉතිරිය<br>රු.මිලියන | |
| පුනරාවර්තන | 161.44 | 149.85 | 11.59 | 7.18 |
| මූලධන | 147.86 | 118.39 | 29.47 | 19.93 |
| **එකතුව** | **309.30** | **268.24** | **41.06** | **13.28** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20801 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13.39 | 7.75 | 5.89 | 7.81 | 45.00 | 27.07 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 5.12 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කලමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.385,229 ක් වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20801 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 664,309 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය**

-----------------------------------------

**3.3.1 අභ්‍යන්තර විගණනය**

----------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව**

--------------------------------------

දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව සමාලෝචිත වර්ෂයේදී රැස්වී නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවත්වීම**

-------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් කොළඹ හා ප්‍රාදේශීය කෞතුකාගාර 8 ක පැවැති කෞතුක භාණ්ඩ එම භාණ්ඩ සමීක්ෂණයට ඇතුළත්ව නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

-----------------

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ජාතික කෞතුකාගාර පනත සංශෝධනය කිරීම**

---------------------------------------------------

1942 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත පරිච්ඡින්න කර ශ්‍රී ලංකාවේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට අනුරූප වන අයුරින් නව පනතක් නිර්මාණය කිරීමේ අරමුණින් 2014 අගෝස්තු 29 දින අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් එය සාකච්ඡා කිරීමෙන් පසු ලබා දී තිබුණු නියමයන්ට අනුව නීති කෙටුම්පත් සම්පාදක ලවා සංශෝධන සිදුකර 2015 ජූලි 07 දින වන විට අවසන් කර තිබුණි. 2016 මැයි මාසය වන විටත් නව පනත සංශෝධනය කිරීමේ කටයුතු නිම කිරිමට නොහැකි වි තිබුණි.

**(ආ) සූක්ෂ්ම ඡායාගත කිරීම**

-------------------------

කොළඹ ජාතික කෞතුකාගාරයේ පුස්තකාලය යටතේ පැවති සූක්ෂ්ම ඡායාගත කිරීමේ ඒකකය 2012 දෙසැම්බර් මාසයේ සිට ඡායාරූප ශිල්පී අංශය යටතට පවරා තිබුණි. සූක්ෂ්ම ඡායාගත කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි. පුස්තකාලය සතු ඉපැරණි පොත් හා පුස්කොළ පොත්වල ඇතුළත් තොරතුරු වෙනත් මාධ්‍යයක ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා විධිමත් විකල්ප වැඩසටහනක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) කෞතුක භාණ්ඩ ලේඛනගත කිරීම හා ඡායාරූපගත කිරීම**

---------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මහනුවර ජාතික කෞතුකාගාරය සතුව ඇති කෞතුක භාණ්ඩ වර්ග 43 කට අයත් අයිතම 6063 ක් විධිමත් පරිදි ලේඛනගත කිරීම හා ඡායාරූප ගත කිරීම සිදුකර නොතිබුණි.

**(ii)** දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, රත්නපුර හා ඕලන්ද නිදහස් අනුස්මරණ කෞතුකාගාරවලට අයත් කෞතුක භාණ්ඩ වර්ග 248 කට අයත් අයිතම 4329 ක් විධිමත් ලෙස ඡායාරූප ගත කර නොතිබුණි.

**(ඈ) රත්නපුර කෞතුකාගාරය අළුත්වැඩියා කිරීම**

--------------------------------------------------

**මේ සම්බන්ධයෙන්** පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම**

------------------------------------------------------

මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා සබරගමුව පළාත් සභාවේ ඉංජිනේරු සේවා කාර්යාලය විසින් රු.3,613,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් 2013 මාර්තු මාසයේදී කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සඳහා 2014 වර්ෂයේදී රු.3,613,000 ක් සබරගමුව පළාත් ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත ගෙවා තිබුණි. මුදල් ගෙවා වර්ෂ දෙකක් ඉක්මවා තිබුණත් 2016 අප්‍රේල් මාසය වන විටත් එහි ඉදිකිරීම් කටයුතු නිමකර ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණි.

(ii) **වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම.**

---------------------------------------

රත්නපුර කෞතුකාගාරය අළුත්වැඩියා කිරීම යටතේ එහි වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කටයුතු සබරගමුව පළාත් සභාවේ ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත පවරා තිබුණි. 2014 නොවැම්බර් 19 දින ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුව අනුමත කර තිබුණි. මේ සඳහා කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාත් ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත රු.1,858,000 ක් අවස්ථා තුනකදී ගෙවා තිබුණි. 2016 අප්‍රේල් මාසය වන විටත් මෙම අළුත්වැඩියාවට අදාළ කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

**(iii) කෞතුකාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම**

----------------------------------------------------

කෞතුකාගාර ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු සබරගමුව පළාත් සභාවේ ඉංජිනේරු සේවා කාර්යාලය වෙත පවරා තිබුණි. මේ සඳහා රු.5,771,000 ක් වූ ඇස්තමේන්තුව අනුමත කර 2015 ඔක්තෝබර් 26 දින කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. 2015 වර්ෂයේදී ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය වෙත රු.5,771,000 ක මුළු මුදලම ගෙවා තිබුණද, 2016 අප්‍රේල් මාසය වන විටත් අළුත්වැඩියා කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ඉ) මහනුවර කෞතුකාගාරයේ අළුත්වැඩියා කටයුතු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **යකඩ වැට ඉදිකිරීම**

---

**මහනුවර කෞතුකාගාරයේ යකඩ** වැට ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.4,759,000 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් මත 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. නමුත් 2016 අප්‍රේල් මාසය වන විටත් එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි**.**

(ii) **කෞතුකාගාර ගොඩනැගිල්ල හා නිල නිවාසය අළුත්වැඩියාව**

---

මහනුවර කෞතුකාගාරයේ ගොඩනැගිල්ල හා නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා 2014 වර්ෂයේදී පිළිවෙලින් රු.16,990,000 ක් හා රු.3,400,000 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. මෙම අළුත්වැඩියා කටයුතු නිසා 2014 සැප්තැම්බර් 10 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කෞතුකාගාරය වසා තබන බව නිවේදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අළුත්වැඩියා කටයුතු 2016 අප්‍රේල් මාසය වන විටත් අවසන් නොවීම නිසා මාස 18 කට වැඩි කාලයක් කෞතුකාගාරය වසා තිබීමෙන් මහජනතාවට එය නැරඹීමට ඇති අවස්ථාව අහිමි වී තිබුණි. 2014 වර්ෂයේදී රු.4,914,525 ක් ආදායමක් රැස්කර තිබුණු මෙම කෞතුකාගාරයෙන් 2015 වර්ෂයේදී කිසිදු ආදායමක් රැස්කර නොතිබුණි.
- මෙම කෞතුකාගාරයේ මැද කොටසේ ගල් ඇතිරීම සඳහා 2015 දෙසැම්බර් මාසයේදී රු.4,914,525 ක් වූ ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. 2016 අප්‍රේල් මාසය වන විටත් එම කාර්ය ආරම්භ කර නොතිබීම නිසා කෞතුකාගාරය විවෘත කිරීම තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි.

**(ඊ) නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත වැටීම**

---

කොළඹ ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු හේතුවෙන් 2014 අගෝස්තු මාසයේ සිට මැදිරි 15 න් 8 ක් වසා තිබුණි. කොළඹ ජාතික කෞතුකාගාරය හා ස්වභාවික විද්‍යා කෞතුකාගාරය සඳහා ඒකාබද්ධ ටිකට් පතක් 2015 ජනවාරි 01 දින සිට නිකුත් කිරීම නිසා 2014 වර්ෂයේ රු.12,357,360 ක් වූ ආදායම 2015 වර්ෂයේදී රු.24,854,080 දක්වා සියයට 100 කින් ඉහළ ගියද, නරඹන්නන්ගේ සංඛ්‍යාව 249,950 සිට 203,403 දක්වා 46,547 කින් අඩු වී තිබුණි.

**3.6 පාඩු හා හානි**

---

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **කෞතුකාගාර අධිකාරි නිල නිවස (රත්නපුර) අළුත්වැඩියා කිරීම**

---

රත්නපුර කෞතුකාගාර භූමියේ පිහිටි කෞතුකාගාර අධිකාරි නිල නිවස අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන සබරගමුව පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය මගින් 2013 වර්ෂයේදී රු.1,079,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමත කර තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කර

වසර 3 ක් ඉක්ම ගියද අළුත්වැඩියා නොකළ මෙම ගොඩනැගිල්ල 2016 අප්‍රේල් මාසය වන විට දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) **කෞතුකාගාරයේ සිදුවී තිබුණු සොරකමට අදාල අධිකරණමය ක්‍රියාමාර්ග**

2012 මාර්තු 16 දින කොළඹ ජාතික කෞතුකාගාරයේ සිදු වූ සොරකම නිසා අස්ථානගතව තිබූ කෞතුක භාණ්ඩ ප්‍රමාණය 221 ක් වූ අතර එම භාණ්ඩවල වටිනාකම රු. 4,440,140 කට තක්සේරු කර තිබුණි. ඉන් භාණ්ඩ 94 ක් මුල් තත්ත්වයෙන්මද භාණ්ඩ කොටස් හා ගල් වශයෙන් 57 ක්ද නැවත හමු වී තබුණි. අනෙකුත් භාණ්ඩ කපා , තලා දැමීම නිසා විනාශයට පත්ව තිබුණි. 2016 ජුනි මාසය වන විටත් අධිකරණමය ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි.

**3.7** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 06 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 123 | 70 | 53 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 258 | 189 | 69 |
| | **එකතුව** | **400** | **266** | **134** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **කෞතුකාගාර සහායක තනතුරු පුරප්පාඩු**

2015 සැප්තැම්බර් මාසය වන විට කෞතුකාගාර සහායක තනතුරේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබූ අතර කුසලතාවය අනුව තේරී පත්වූ අයදුම්කරුවන්ට පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට නියමිතව තිබුණි. ඒ සඳහා කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් 2015 ඔක්තෝබර් මාසයේදී අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඒ සඳහා සහභාගීවීමට හැකි දිනයක් ලිපියක් මගින් ඉල්ලා තිබුණි. නමුත් කිසිදු සාධාරණ පදනමක් නොමැතිව ඉහත සම්මුඛ පරීක්ෂණ අවලංගු කළ බව 2016 ජුනි මාසයේදී අමාත්‍යාංශ ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි. මෙම තත්ත්වය තුළ නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් කෞතුකාගාර සහායක පිරිසක් යොදවා මැදිරි විවෘත කරවා තැබීම, කෞතුක භාණ්ඩවල ආරක්ෂාවට තර්ජනයක් බව අනාවරණය විය.

(ආ) **ඡායාරූපගත කිරීමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු**

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ කාර්ය මණ්ඩලයට අනුමත ඡායාරූප ශිල්පී තනතුරු 01 ක් පමණක් ඇතුළත්ව තිබුණි. ඡායාරූප අංශය යටතට පත් කර තිබුණු සූක්ෂම ඡායාරූප ශිල්පී අංශයේ පවතින යන්ත්‍ර උපකරණ සම්බන්ධව ගත යුතු පියවර පරීක්ෂාව සඳහා තාක්ෂණික කමිටුවක් පත්කර තිබුණි. එම අංශයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වූ කමිටුවේ යෝජනා අනුව සහකාර ඡායාරූප ශිල්පී (Assistant Reprographers ) නිලධාරීන් 3 දෙනෙකු බඳවා ගත යුතු නමුත් අනුමත කර තිබුණු කාර්ය මණ්ඩලයට එය ඇතුළත් කර නොතිබිණි.

(ඇ) **පුරප්පාඩු පැවතීම කෞතුක භාණ්ඩවල ආරක්ෂාවට තර්ජනයක් වීම**

---

කොළඹ කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම සහ 2014 නොවැම්බර් 16 දින රාත්‍රියේ සිදු වූ අනවසර ඇතුළුවීම වැනි සිදුවීම් මත කෞතුකාගාරයේ ආරක්ෂාව පිළිබඳ ගැටළු පැවතියද, 2013 මැයි 23 දින අනුමත කර තිබූ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර ද, කෞතුකාගාර ආරක්ෂක (curator) තනතුරු 10 න් 06 ක්ද, ආරක්ෂක සහකාර තනතුරු 05 කද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.